කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
விவசாயத் திணைக்களம்
DEPARTMENT OF AGRICULTURE

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය
பீடைகொல்லி பதிவு அலுவலகம்
Office of the Registrar of Pesticides

අංක 1056, ගැටඹේ, තැ.පෙ. 49, පේරාදෙණිය 20400, ශ්‍රී ලංකාව
இல 1056, கெடம்பே, த.பெ.இல 49, பேராதனை 20400, இலங்கை
No. 1056, Getambe, P.O. Box 49, Peradeniya 20400, Sri Lanka

දුරකථන/தொலைபேசி/Telephone : (94)812388076/388135
ෆැක්ස්/தொலைநகல்/Fax : (94)812388135
ඊ මේල්/மின்னஞ்சல்/E-mail : pest@slt.lk
වෙබ්/மின்னஞ்சல்/Web : www.doa.gov.lk

මගේ අංකය / எனது எண் / My No: RP/VII/I2    ඔබේ අංකය / உமது எண் / Your No:    දිනය / திகதி / Date: 2017-05-23

චක්‍රලේඛ/ආර්.ඕ.පී/පී.සී.එස්/2017/1

සියලුම ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන ප්‍රධානීන් වෙත,

## මහජන සෞඛ්‍ය හා මහජන පීඩා සම්බන්ධ පළිබෝධ පාලනය සඳහා රසායන ධූමකරණය සහ සීමාකරන ලද පළිබෝධනාශක භාවිතය

ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන විසින් මහජන සෞඛ්‍ය හා මහජන පීඩාකාරී මැස්සන් හා මදුරුවන් මර්දනය කිරීම සඳහා කෘමිනාශක ධූමකරණය ඉතා අක්‍රමවත් ආකාරයෙන් සිදුකරන බවට ප්‍රාදේශීය සෞඛ්‍ය අංශ වෙතින් මා වෙත පැමිණිලි ඉදිරිපත් වී ඇත. ජාතික වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත්ව සිදු කරන මදුරු මර්දන වැඩසටහන් සඳහා ප්‍රමුඛත්වය ලබා දීමේ අරමුණ පෙරදැරිව පෞද්ගලික අංශයේ පළිබෝධ පාලන සේවා සපයනු ලබන ආයතන විසින් පවත්වා ගත යුතු කාර්ය පටිපාටිය අවධාරණය කිරීම මෙම චක්‍රලේඛයේ අරමුණ වේ.

02. 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නිකුත් කර ඇති අංක 1655/6 හා 2010.05.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සියළුම පළිබෝධ පාලන සේවා සපයනු ලබන ආයතන පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරනු ලබන වලංගු බලපත්‍රයක් යටතේ සේවා සැපයිය යුතුය. 2017 අප්‍රේල් 30 දින වන විට පෞද්ගලික අංශයේ පළිබෝධ පාලන සේවා සපයනු ලබන ආයතන 52 ක් නිසි ඇගයුම් ක්‍රියාවලියක් මඟින් පරීක්ෂා කර බලා ලියාපදිංචි කිරීමට කටයුතු ඇති අතර, රාජ්‍ය අංශයේ පළිබෝධ පාලන සේවා සපයනු ලබන ආයතන ද ඉහත කී රෙගුලාසි ප්‍රකාරව ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කරමින් පවතී. පවත්නා තාක්ෂණික සහ සේවා නිපුණතාවය අනුව එක් එක් බලපත්‍රලාභී පළිබෝධ පාලන සේවා සපයනු ලබන ආයතන සතු සේවා විෂය පථය වෙනස් විය හැකි අතර, එම සේවා විෂය අතර සාමාන්‍ය ගෘහාස්ථ පළිබෝධ පාලනය සඳහා ප්‍රධාන ස්ථානයක් හිමි වේ.

03. පළිබෝධ පාලනයේ දී භාවිතයට ගැනෙන රසායනික පළිබෝධනාශක භාවිතා කිරීමේ දී මහජන සෞඛ්‍යයට සිදුවිය හැකි අනතුරු හා පාරිසරික හානි අවම කරගනිමින් සුදුසු ආරක්ෂක පියවරයන් හා නිසි ආරක්ෂාකාරී උපදෙස් ලබාදිය හැකි පුද්ගලයින් මගින් මෙම කාර්යාවලිය සිදුකිරීම සහතික කිරීම ලියාපදිංචි කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වන අතර, ඒ අනුව සෑම පළිබෝධ පාලන කටයුත්තක දී ම විශේෂඥ අධීක්ෂණය (Professional Supervision) ලබා දීම අනිවාර්ය අවශ්‍යතාවයකි. පළිබෝධ පාලනය සඳහා භාවිතා කරනු ලබන නිර්දේශිත යම් යම් රසායනික ද්‍රව්‍ය අධික අනතුරු විය හැකි සංයෝග වන අතර, තවත් සමහරක් රසායනික ද්‍රව්‍ය (උදා: කෘත්‍රිම පයිරෙත්‍රොයිඩ) ඉතා දැඩි සීමා කිරීම් යටතේ භාවිතා කිරීමට නිර්දේශිත සංයෝග වේ.

04. විශේෂයෙන්ම මදුරුවන් මර්දනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ඩෙංගු මර්දන ඒකකය, මැලේරියා මර්දන ව්‍යාපාරය හා ජාතික බරවා මර්දන ඒකකය යන ආයතන විසින් ජාතික කර්තව්‍යයක් ලෙස සිදුකරන මදුරුවන් පාලනය කිරීමේ වැඩසටහන් සඳහා ද සීමාකරන ලද පළිබෝධනාශක භාවිතා වේ. එම නිසා අවිධිමත් පළිබෝධනාශක භාවිතය මඟින් ප්‍රතිරෝධී මදුරු විශේෂ බිහිවිය හැකි ප්‍රවණතාවන් හා එමගින් ජාතික මදුරු මර්දන වැඩසටහන ඇතිවිය හැකි අවදානම සලකා එවැනි රසායන වර්ග භාවිතය දැඩි සීමාවන්ට යටත් කොට ඇත. මේ අනුව, සීමාකරන ලද පළිබෝධනාශක භාවිතය මදුරු මර්දනය සඳහා වූ නිර්දේශවලින් පරිබාහිර වෙනත් නිර්දේශිත අවශ්‍යතාවයන් සඳහා භාවිතා කිරීමේ දී නිර්දේශිත සීමාවන්ට යටත්ව ආරක්ෂාකාරී හා කාර්යක්ෂම ලෙස සිදුකිරීමේ කාර්යයේ ප්‍රධාන වගකීම ඉහත කී ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන වෙත පැවරේ. මේ අනුව, සීමාකරන ලද පළිබෝධනාශක ආනයනය කරනු ලබන ආයතන වෙතින් පළිබෝධනාශක තොග මිලදී ගැනීමේ දී එක් එක් මිලදී ගැනීම් වාරයක් පාසා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතියක් ලබාගත යුතුය.

05. ජාතික වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත්ව සිදු කරන මදුරු මර්දන වැඩසටහන්වලට සමගාමීව ප්‍රාදේශීය වශයෙන් මහජන සෞඛ්‍ය හා මහජන පීඩාකාරී මැස්සන් හා මදුරුවන් මර්දනය කිරීම සඳහා රජයේ හා පෞද්ගලික අංශයේ රෝහල් සහ ආයතන මගින් මෙන්ම සාමාන්‍ය මහජනතාව විසින් ද ඉහත කී සීමාකරන ලද පළිබෝධනාශක භාවිතා කිරීම සඳහා ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන වෙත ඉල්ලීම් ඉදිරිපත් කෙරෙන අවස්ථාවල දී ජාතික මදුරු මර්දන වැඩසටහන්වලට බාධා ඇති නොකෙරෙන අයුරින් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පනවා ඇති සීමාකාරී තත්ත්වයන් පවත්වා ගන්නා බවට සියළුම ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන විසින් වග බලා ගත යුතුය; ඒ සඳහා තම ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය දැනුවත් කළ යුතුය.

06. නිවාස, ගොඩනැගිලි සහ ඉතා සීමාසහිත ප්‍රදේශයක් පමණක් ඉලක්ක කර රසායන ධූමකරණය සිදු කිරීම රෝග වාහක මදුරු මර්දනයේ ඉතා අසාර්ථක ක්‍රියාකාරකමක් බව අවධාරණය කරමි.

07. මදුරු මර්දන වැඩසටහන් සඳහා කෘමිනාශක භාවිතය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ අනුදැණුම හා නිසි අධීක්ෂණය යටතේ සිදුවිය යුතුවීම අත්‍යාවශ්‍ය වේ. මෙම ජාතික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන විසින් රසායන ධූමකරණය සිදුකරමින් මදුරු මර්දන සේවා සිදු කිරීම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ අනුදැනුම මත පමණක් සිදු කළ යුතු බවට උපදෙස් ලබා දෙමි.

මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් කරුණාකර මා වෙත දන්වා එවන්න.

ආචාර්ය ජේ.ඒ. සුමිත්
වැ.බ. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්

පිටපත් -

1. ලේකම් - සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශය -කා.දැ.ස.
2. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් -කා.දැ.ස.
3. අධ්‍යක්ෂ - මැලේරියා මර්දන ඒකකය -කා.දැ.ස.
4. අධ්‍යක්ෂ - ජාතික ඩෙංගු මර්දන ඒකකය -කා.දැ.ස.
5. අධ්‍යක්ෂ - ජාතික ඩෙංගු මර්දන ඒකකය -කා.දැ.ස.